**<u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>**

**<u>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය</u>**

**<u>ස්වදේශ කටයුතු අංශය</u>**

**<u>භාණ්ඩ, වැඩ සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම- 2025/2026 වර්ෂය</u>**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය සඳහා 2025/2026 වසරට අදාලව භාණ්ඩ, වැඩ සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ.

02. 2025.08.12 දින සිට 2025.09.26 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා රු. 200.00 ක ගාස්තුවක් (ලිපි ද්‍රව්‍ය ගාස්තු) නිල මැඳුර පරිපාලන සංකීර්ණයේ 16 වන මහලේ පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ , මූල්‍ය අංශයේ සරප් කවුන්ටරය වෙත ගෙවා ලබා ගන්නා වූ රිසිට්පත සමඟ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ශාඛාවෙන් අදාළ අයදුම්පත්‍රය හා අනෙකුත් ලියවිලි ලබා ගත හැකි අතර ස්වදේශ කටයුතු අංශයේ නිල වෙබ් අඩවිය වන www.moha.gov.lk වෙබ් අඩවිය වෙත පිවිස මෙම අයදුම්පත්‍රය හා අනෙකුත් ලියවිලි බාගත කර ගැනීම සඳහාද පහසුකම් සලසා ඇත. එකී සඳහන් කාල සීමාව තුළ දී www.moha.gov.lk වෙබ් අඩවිය මඟින් අදාළ ලේඛන පරික්ෂා කිරීමේ අවස්ථාව සැපයුම්කරුවන් වෙත ලබා දී ඇත.

03. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2025.09.26 දිනට පෙර ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය මූල්‍ය අංශය, 16 වන මහල, "නිල මැඳුර", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ ගෙනැවිත් භාර දිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ," සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025/2026" යනුවෙන් සඳහන් කළ යුතුය. ලියාපදිංචි වීමට කැමති එක් එක් අයිතමයන් සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එම සියලුම අයදුම්පත් වෙන වෙනම කවර වල බහා එවිය යුතුය. සෑම සැපයුම් කරුවෙක්ම ලියාපදිංචි වීමට අපේක්ෂිත එක් එක් අයිතමය සඳහා රු 500/- ක ආපසු නොගෙවන තැන්පතු මුදලක් ගෙවිය යුතු අතර එම මුදල සඳහා "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය" නමින් ලබාගත් මුදල් ඇණවුමක් (ලැබෙන කාර්යාලය- නාරාහේන්පිට තැපැල් කාර්යාලය/කම්කරු දෙපාර්තමේන්තු තැපැල් කාර්යාලය) හෝ මෙම කාර්යාලයේ සරප් කවුන්ටරයට මුදල් ගෙවා ලබාගත් රිසිට්පතක් හෝ අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

04. ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කිරීමේ හෝ නොකිරීමේ අයිතිය අමාත්‍යාංශ ලේකම් සතුවේ.

05. ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත් කරුවන්ගෙන් මිල ගණන් කැඳවා භාණ්ඩ හා සේවා සැපයීමට සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ක්‍රියාකරන අතර, ප්‍රමාණවත් ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති විට බාහිර ආයතන වලින් මිල ගණන් කැඳවා මිලදි ගැනීමේ අයිතිය අමාත්‍යාංශ ලේකම් සතුවේ.

06. මිල ගණන් කැඳවීමේදී මිල ගණන් ඉදිරිපත් නොකරන්නා වූ ද, ඇණවුම් සඳහා නියමිත වේලාවට භාණ්ඩ නොසපයන්නා වූ ද ඉදිරිපත් කළ සාම්පල් අනුව භාණ්ඩ නොසපයන්නා වූ ද සැපයුම්කරුවන්ගේ නම් දැන්වීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරීමේ බලය අමාත්‍යාංශ ලේකම් වෙත පැවරේ.

07. මේ සම්බන්ධ සියළු විස්තර ඉහත සඳහන් වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වන්නේ **2025.09.26** දින දක්වා පමණි.

වැඩි විස්තර සඳහා දුරකථන අංකය - 011-2050416

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය
"නිල මැඳුර",
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.